# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 14/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 04/01/2024

පැය 1230

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. 2024.01.03 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 07 | 07 | 183.5 | 720 | බූලි 02<br>බැරල් 04<br>තඹ දඟර 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර**

2024.01.03 වන දින අළුයම් කාලයේ පුත්තලම පොලිස් වසමේදී පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 220 ක් සමඟ සැකකරුවකු** අත්අඩංගුවට ගෙන පුත්තලම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 55 ක් වූ පුත්තලම ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ. පුත්තලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. නීති විරෝධී ලෙස වැලි කැණීම් කර ට්‍රැක්ටර් රථයකට පටවමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරුගම්බේ කඳවුර**

2024.01.03 වන දින සවස් කාලයේ පොතුවිල් පොලිස් වසමේදී පොලිස් විශේෂ කාර්ය බලකා අරුගම්බේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී ලෙස වැලි කැණීම් කර ට්‍රැක්ටර් රථයකට පටවමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන අරුගම්බේ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22 හා 25 වයස් වල පසුවන පොතුවිල් පදිංචිකරුවන් වේ. පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. ගංජා හේනක් වැටලා සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුර**

2024.01.03 වන දින සවස් කාලයේ ලුණුගම්වෙහෙර පොලිස් වසමේදී පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී ලෙස අක්කර ½ ක පමණ භූමි ප්‍රමාණයක වගා කර තිබූ අඩි 7.5 ක් පමණ උසට වැඩුනු ගංජා ගස් 9852 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ලුණුගම්වෙහෙර පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වූ තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. ලුණුගම්වෙහෙර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. රජයේ රක්ෂිත ප්‍රදේශයට අනවසරයෙන් ඇතුළු වී එළි පෙහෙලි කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කැබිතිගොල්ලෑව කඳවුර**

2024.01.03 වන දින සවස් කාලයේ හොරොව්පතාන පොලිස් වසමේදී පොලිස් විශේෂ කාර්ය බලකා කැබිතිගොල්ලෑව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **රජයේ රක්ෂිත ප්‍රදේශයට අනවසරයෙන් ඇතුළු වී අක්කර හතරකට ආසන්න පමණ භූමි ප්‍රමාණයක් එළි පෙහෙලි කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන හොරොව්පතාන පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 59 ක් වූ හොරොව්පතාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. හොරොව්පතාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**